

Hayleys FABRIC

# සමාජ වගකීම් ප්‍රතිපත්තිය

හේලීස් ෆැබ්රික් ආයතනයේ අප, මානව සම්පත අපගේ ව්‍යාපාරයට තරඟකාරී වාසියක් අත්පත් කර දීමට ඉවහල් වන ප්‍රමුඛතම සාධකයක් සේ සලකනු ලබන අතර, විශිෂ්ටත්වය කරා යන ගමනේදී එය වඩාත් වැඩි දියුණු කොට ඉදිරියට පවත්වා ගැනීමේ අවශ්‍යතාවය දකින්නෙමු.

අප අපගේ සමාජ වගකීම් මැනවින් හඳුනන අතර, ඒ වෙනුවෙන් අප ව්‍යාපාර කටයුතු අචාරශීලීව හා විනිවිදභාවයෙන් යුතුව සිදුකිරීමට කැප වන්නෙමු.

ඒ අනුව හේලීස් ෆැබ්රික් ආයතනයේ සියලු මෙහෙයුම් කටයුතු

- **"ETI Base Code"** නම් වූ ව්‍යාපාර අචාරධර්ම පද්ධතියේ සියලු වගන්ති,
- අදාල වන සියලු දේශීය කම්කරු නීති රීතීන්,
- ජාත්‍යන්තර කම්කරු අණ පනත් හා නිත්‍යානුකූල ලේඛණ,
- ජගත් මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා වූ නිර්දේශ හා සලාකාබැලීම් යනාදියට අනුකූලව පවත්වා ගැනීමට අපේක්ෂා කරයි.

අප සමාජ වගකීම් ප්‍රතිපත්තිය, සඵලදායීව ලේඛණගත කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වා ගැනීම, සන්නිවේදනය කිරීමත් එය වඩාත් සවිස්තරාත්මකව සෘජුව හෝ වෙනයම් අයුරකින් අප ආයතනය නියෝජනය කරන සෑම මට්ටමක සමාජිකයෙකු වෙතට පිවිසිය හැකි ලෙස ද සකස් කරන්නෙමු.

කාලානුරූපීව අදාල නීතිරීති හා රෙගුලාසි හෝ ගැණුම්කරුවන්ගේ අවශ්‍යතා වෙනස්වීම සැලකිල්ලට ගනිමින්, මෙම සමාජ වගකීම් ප්‍රතිපත්තිය අප විසින් අඛණ්ඩව ඇගයීමට ද ලක් කරනු ඇත.

රොහාන් ගුණතිලක

කළමනාකරණ අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිලධාරී

මැයි, 2016

The World Of Hayleys Since 1878